කොමසාරිස්:
அணையாளர்: 2820795
Commissioner:

ෆැක්ස්
பெக்ஸ் 2820792
Fax

ඊ මේල් :
ஈ மேல்: info@imdept.wp.gov.lk
E mail:

කාර්යාලය :
காரியாலயம் : 2820792
Office :

මගේ අංකය : බප/ආයු/ආ2/
எனது இல: පොදු
My No :

ඔබේ අංකය :
உமது இல :
Your No :

# ආයුර්වේද දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත
ஆயுர்வேதத் திணைக்களம்
மேல் மாகாணம்
DEPARTMENT OF AYURVEDA
Western province

නො 18, නාවල පාර, නුගේගොඩ. No. 18, Nawala Road, Nugegoda.

දිනය :
திகதி : 2020.11. 25
Date :

අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරී/කාර්යභාර වෛද්‍ය නිළධාරී/
දිස්ත්‍රික් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී,
පළාත් ආයුර්වේද රෝහල/දිස්ත්‍රික් ආයුර්වේද රෝහල/ග්‍රාමීය ආයුර්වේද රෝහල/
ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව/ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානය/
දිස්ත්‍රික් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය,
...............................................................,

**<u>කොවිඩ් මර්ධනය සඳහා සැකසූ " සුවෙන් සිටිමු" "stay safe" ඩිජිටල් ව්‍යාපෘතිය ජනපතිට හඳුන්වා දෙයි.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් සෞඛ්‍ය,දේශීය වෛද්‍ය සමාජ සුබ සාධන ,පරිවාස හා ළමා රක්ෂක සේවා,කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක WPH/PLN/D06/6-1/2020 හා 2020.11.24 දිනැති ලිපිය හා බැඳේ.(පිටපත අමුණා ඇත.)

ඒ අනුව staysafe.gov.lk වෙත පිවිසීමෙන් ඔබ ආයතනයකට අනන්‍ය QR කේතයක් ලබා ගෙන එම QR කේතය මුද්‍රණය කර ආයතනයේ දොරටුවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

තවද,එම මාධ්‍ය නිවේදනයේ උපදෙස් වලට ඔබගේ විශේෂ අවධානය යොමු කර ඒ අනුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

(signed)
කේ.එම්.එන් වික්‍රමසිංහ,
පරිපාලන නිළධාරි ,
ආයුර්වේද කොමසාරිස්(බ/ප) වෙනුවට.

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා,
කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත
சுகாதார, உள்நாட்டு வைத்திய, சமூக நலன்புரி, நன்நடத்தை மற்றும் சிறுவர்
பாதுகாப்பு சேவைகள், மகளிர் விவகாரம், சபை நடவடிக்கை அமைச்சு மேல் மாகாணம் -
MINISTRY OF HEALTH, INDIGENOUS MEDICINE, SOCIAL WELFARE, PROBATION AND
CHILD CARE SERVICES, WOMEN AFFAIRS AND COUNCIL AFFAIRS - WESTERN PROVINCE
Web: www.healthmin.wpc.gov.lk

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | WPH/PLN/DO6/6-1/2020 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2020-11-24 |

බස්නාහිර පළාත් ... ආයුර්වේද ...
24 NOV 2020
ලැබුණා

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(බ.ප),
පළාත් ආයුර්වේද කොමසාරිස්(බ.ප),
පළාත් පරිවාස කොමසාරිස් (බ.ප),
පළාත් සමාජසේවා අධ්‍යක්ෂ (බ.ප),

**කොවිඩ් මර්ධනය සඳහා සැකසූ "සුවෙන් සිටිමු" "stay safe" ඩිජිටල් ව්‍යාපෘතිය ජනපතිට හඳුන්වා දෙයි.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා වෙත යොමු කර ඇති ප්‍රධාන ලේකම් ගේ අංක CSWP/ADM/IT-05/53/F1/06 YD හා 2020.11.11 දිනැති ලිපිය හා බැදේ (පිටපත අමුණා ඇත).

02. එම මාධ්‍ය නිවේදනයේ දක්වා ඇති පරිදි, කොවිඩ් 19 පැතිරීම වැලැක්වීමටත් එය පැතිරෙන මාර්ග අවහිර කිරීමටත් කොවිඩ් 19 වෛරසයට නිරාවරණය වූවන් හඳුනා ගැනීම, ඔවුගේ විස්තර සොයාගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය(ICTA) මගින් Stay Safe මෘදුකාංගය හඳුන්වා දී ඇත. ඒ අනුව පෞද්ගලික ව්‍යාපාර ස්ථාන, රාජ්‍ය ආයතන සහ ආගමික ස්ථාන වලට ඇතුළුවන පිටස්තර පුද්ගලයන් ඉලෙක්ට්‍රොනිකව ලියාපදිංචි කිරීමත් එකී පුද්ගලයන් ඇතුළුවන සහ පිටවන වේලාවන් QR කේතය Scan කිරීමෙන් මෘදුකාංගයට ඇතුළත් කිරීමක් සිදු කරයි. එසේම 1919 අංකයට කෙටි පණිවුඩයක් යොමු කිරීම මගින්ද, ලියාපදිංචි කිරීමත් එකී පුද්ගයන් ඇතුළුවන සහ පිටවන වේලාවන් Stay Safe මෘදුකාංගය ඇතුළත් කිරීමත් සිදු කළ හැකිය.

03. ඒ අනුව staysafe.gov.lk වෙත පිවිසීමෙන් ඔබ ආයතනයකට අනන්‍ය QR කේතයක් ලබා ගෙන එම QR කේතය මුද්‍රණයකර ආයතනයේ දොරටුවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. තවද, එම මාධ්‍ය නිවේදනයේ උපදෙස් වලට ඔබගේ විශේෂ අවධානය යොමු කර ඒ අනුව කටයුතු කරන ලෙසත්, ඔබ ආයතනය යටතේ ඇති සියළුම කාර්යාල/ආයතන හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එච්.ජී.ජී.පේ.ධර්මසේන,
ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ
සභා කටයුතු අමාත්‍යාංශය(බ.ප)

A-O

පිටපත:

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(කොළඹ/ ගම්පහ/ කළුතර)- කරු.අ.ක.ස

8 වන මහල, ප්‍රධාන ලේකම් කාර්යාල සංකීර්ණය, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
8வது மாடி, பிரதம செயலாளர் காரியாலய வளாகம், இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
8th Floor, Chief Secretary's Office Complex, No. 204, Densil Kobbekaduwa Mawatha, Battaramulla.

| | අමාත්‍යාංශය - පොදු / அமைச்சு - பொது / Ministry - General | අමාත්‍යාංශ ලේකම් / அமைச்சு செயலாளர் / Secretary to the Ministry | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / சிரேஷ்ட உதவி செயலாளர் / Senior Assistant Secretary | අධ්‍යක්ෂ සැලසුම් / பணிப்பாளர் - திட்டமிடல் / Director – Planning | ප්‍රධාන ගණකාධිකාරී / பிரதம கணக்காளர் / Chief Accountant |
|---|---|---|---|---|---|
| ☎ | 0112 092698 | 0112 092704 | 0112 092697 | 0112 092694 | 0112 092701 |
| Fax | 0112 092690 | 0112 092705 | 0112 092690 | 0112 092715 | 0112 092706 |
| e-mail | info@healthmin.wpc.gov.lk | secretary@healthmin.wpc.gov.lk | - | - | - |

10 NOV 2020

PRESS RELEASE

Fax : 011 2 333717
President's Media Division, President's Office, Colombo 01

නිවේදන අංක - 382
2020-11-04 ප.ව 5.20 ට

# කොවිඩ් මර්දනය සඳහා සැකසුණු "සුවෙන් සිටිමු" (Stay Safe) ඩිජිටල් ව්‍යාපෘතිය ජනපතිට හඳුන්වා දෙයි ...

කොවිඩ් මර්දනයට සහායවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මගපෙන්වීමෙන් සැකසුණු "සුවෙන් සිටිමු" (Stay Safe) ඩිජිටල් ව්‍යාපෘතිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට හඳුන්වා දෙයි.

කොවිඩ් ආසාදිතයන්ගේ සබඳතා සොයා ගැනීම හා වාහකයන්ගේ සංචරණය කොවිඩ් පැතිරීම වැළැක්වීමේ ප්‍රධාන අභියෝග වේ. "සුවෙන් සිටිමු" (Stay Safe) ඩිජිටල් ව්‍යාපෘතිය මේ ගැටළු දෙකටම එකවර විසඳුම් දෙයි.

ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේ දී දෛනිකව හමුවන කොවිඩ් මර්දන කාර්ය සාධක බලකාය අද (04) පෙරවරුවේ රැස්වූ අවස්ථාවේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති ජයන්ත ද සිල්වා මහතා විසින් නව ව්‍යාපෘතිය හඳුන්වාදෙනු ලැබිය.

"සුවෙන් සිටිමු" (Stay Safe) QR කේතයක් මත පදනම් වේ. කොවිඩ් 19 වැළැක්වීමේ නිරත සියලු පාර්ශ්වයන්ට, වාණිජ හා රාජ්‍ය අංශයේ ආයතනවලට සහ සියලුම ජනතාවට පහසුවෙන් භාවිත කළ හැකි සරල ක්‍රමවේදයකින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවේ.

Staysafe.gov.lk වෙත පිවිසීමෙන් සෑම ආයතනයකටම අදාළ QR කේතය ගත හැකිය. ලබන සෙනසුරාදා (07) සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

ස්මාට් ජංගම දුරකථනයක් භාවිතයෙන් ඕනෑම ආයතනයක නම, ලිපිනය, හිමිකරුගේ නම සහ දුරකථන අංකය වැනි තොරතුරු කිහිපයක් දීමෙන් ඉතා පහසුවෙන් QR කේතය ගත හැකිය. එම කේතය මුද්‍රණය කර ආයතනයේ දොරටුවේ ප්‍රදර්ශනය කිරීමට පිළිවන.

ස්මාට් ජංගම දුරකථනයක් ඇති හෝ නැති හෝ සියලුදෙනා ලියාපදිංචි කර ඔවුන් යන එන ස්ථාන හඳුනා ගනු ලැබේ. මේ පිළිබඳව සියලු මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීමට තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය පියවර ගනු ඇත.

කොවිඩ් කාර්ය සාධක බලකාය බස්නාහිර පළාත ඇතුළු දිවයිනේ සියලු ප්‍රදේශවල කොරෝනා ව්‍යාප්තියේ වත්මන් තත්ත්වය ජනාධිපතිතුමාට පැහැදිලි කළේය.

ජනතාව වගකීමෙන් ක්‍රියාකිරීමේ අවශ්‍යතාව ජනාධිපතිතුමා අවධාරණය කළේය. ඇඳිරි නීතිය පැනවීමෙන් පමණක් ජනතාව හැසිරවීම අඛණ්ඩව කළ නොහැකිය. ජන ජීවිතය, රටේ ආර්ථිකය සහ අන් සියලු පැතිකඩ සම්බන්ධව සැලකිල්ලට ගෙන අවබෝධයෙන් යුතුව තීරණ ගත යුතු බව ජනාධිපතිතුමා පැවසීය.

වෛරසය මර්දනයට පිළියමක් සොයා ගන්නා තෙක් රට වසා තැබිය නොහැකි බව පෙන්වා දුන් ජනාධිපතිතුමා සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් සියලු දෙනා දෛනික කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට සූදානම් විය යුතු බව ද පැවසීය. වෛරසය පාලනය සඳහා ඇඳිරි නීතිය තදින් ක්‍රියාත්මක කරන්නැයි ජනාධිපතිතුමා පොලීසියට උපදෙස් දුන්නේය.

ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි, පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග යන මහත්වරු සහ කාර්ය සාධක බලකායේ සාමාජිකයෝ සාකච්ඡාවට එක්ව සිටියහ.

ජනාධිපති මාධ්‍ය අංශය
2020-11-04